# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමඟ ඔබේ හැකියාවන් බෙදාගන්න

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම අංශය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘති කිහිපයක් ද රට වෙත ආකර්ෂණය කරයි.

අධිකාරියේ පවතින පහත දැක්වෙන පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සහකාර අධ්‍යක්ෂ / සංචාරක සංවර්ධන | MM 1-2 | 04 |
| 02. | සහකාර අධ්‍යක්ෂ / නීති | MM 1-2 | 01 |
| 03. | සහකාර අධ්‍යක්ෂ / මූල්‍ය කළමනාකරණය | MM 1-2 | 02 |
| 04. | කණිෂ්ඨ කළමනාකරු / සංචාරක සංවර්ධන | JM 1-2 | 02 |
| 05. | කණිෂ්ඨ කළමනාකරු / වෙබ් ප්‍රසන්ස් (Web Presence) | JM 1-2 | 01 |
| 06. | විමර්ශන නිලධාරී | MA 5-2 | 02 |
| 07. | කළමනාකරණ සහකාර | MA 1-2 | 10 |

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් පහත මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය:

• අවශ්‍ය සුදුසුකම් ඇතුළත් විස්තරාත්මක රැකියා දැන්වීම SLTDA වෙබ් අඩවියේ "Careers" ප්‍රවේශය යටතේ ලබාගත හැක – http://www.sltda.gov.lk/en/careers.

• තනතුරට අදාල අයදුම්පත්‍රය ඉහත වෙබ් පිටුවෙන් බාගත කර අපේක්ෂා කරන තනතුරට අදාලව පුරවා සම්පූර්ණ කල යුතුය.

• සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

• තනතුරෙහි කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට හොඳ ශාරීරික හා මානසික මට්ටමක සිටිය යුතු අතර, රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

• සම්පූර්ණ කරන ලද අයදුම්පත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්දට අදාල සහතික කළ පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් තොරතුරු සමඟ 2026 ජනවාරි 22 වන දින හෝ ඊට පෙර සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, නො: 80, ගාලු පාර, කොළඹ 03 ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

• රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කල යුතුය.

ඉහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය අධිකාරී කළමනාකාරීත්වය සතුය. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය**

තෝරාපත්වන අයදුම්කරුවන් තම වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතුය. අධිකාරිය විසින් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) 15% ක් සහ සේවක භාරකාර අරමුදලට (ETF) 3%ක් දායක වනු ඇත.

**වැටුප**

2025 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025** අනුව වැටුප් ගෙවනු ලැබේ.

පුරප්පාඩු පිරවීම හා බඳවාගැනීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

**සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
**අංක 80, ගාලු පාර,**
**කොළඹ 03.**

**ප්‍රකාශිත දිනය 08.01.2026**

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමඟ ඔබේ හැකියාවන් බෙදාගන්න

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම අංශය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘති කිහිපයක් ද රට වෙත ආකර්ෂණය කරයි.

අධිකාරියේ පවතින පහත දැක්වෙන පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සහකාර අධ්‍යක්ෂ / සංචාරක සංවර්ධන | MM 1-2 | 04 |
| 02. | සහකාර අධ්‍යක්ෂ / නීති | MM 1-2 | 01 |
| 03. | සහකාර අධ්‍යක්ෂ / මූල්‍ය කළමනාකරණය | MM 1-2 | 02 |
| 04. | කණිෂ්ඨ කළමනාකාර / සංචාරක සංවර්ධන | JM 1-2 | 02 |
| 05. | කණිෂ්ඨ කළමනාකාර / වෙබ් ප්‍රසන්ස් (Web Presence) | JM 1-2 | 01 |
| 06. | විමර්ශන නිලධාරී | MA 5-2 | 02 |
| 07. | කළමනාකරණ සහකාර | MA 1-2 | 10 |

## 1. සහකාර අධ්‍යක්ෂ/ සංචාරක සංවර්ධන (පුරප්පාඩු 04)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ).

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉන්ජිනේරු/ සැලසුම්/ සංචාරක කළමනාකරණ/ ව්‍යාපාර කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන/ ව්‍යවසාය කළමනාකරණ/ ගෘහ නිර්මාණ සැලසුම් ශිල්පය / පරිසර/ ආර්ථික විද්‍යාව සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නෙඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

උපාධිය/ ප්‍රවීණතා සහතිකය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (1) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකරණ (JM 1-2) II ශ්‍රේණියේ සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 2. සහකාර අධ්‍යක්ෂ/ නීති (පුරප්පාඩු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ).

නීතිඥයෙකු වීම හා ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී වසර 05 ක සේවා පලපුරුද්දක් ලබා තිබීම සහිතව සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරනු ලබන නොතාරිස්වරයෙකු වීම.

සහ

ඉන් වසරකට (01) නොඅඩු කාලයක් රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයඳුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකරණ (JM 1-2) II ශ්‍රේණියේ සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (5)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 3. සහකාර අධ්‍යක්ෂ/ මූල්‍ය කළමනාකරණ (පුරප්පාඩු 02)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ).
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ්‍ය/ කළමනාකරණය සම්බන්ධ විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL)/ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA)/ සහතික ලත් ඒකාබද්ධ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA)/ ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA) අන්තර් මාධ්‍ය මට්ටමේ විභාග සමත්ව තිබීම.

සහ

උපාධිය/ ප්‍රවීණතා සහතිකය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකරණ (JM 1-2) II ශ්‍රේණියේ සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**

MM 1-2 2025 රු. 94,170/- 10 x රු. 2,480/- 15 x රු. 3,450/- රු. 170,720/- + ( ජීවන වියදම් දීමනාව)

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල අවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- සන්නිවේදන දීමනා
- වෘත්තීය දීමනා
- ණය පහසුකම්

## 4. කණිෂ්ඨ කළමනාකාර/ සංචාරක සංවර්ධන – (පුරප්පාඩු 02)

සුදුසුකම්

**බාහිර අයදුම්කරුවන්**

(අ).

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංචාරක සැළසුම්/ සංචාරක සංවර්ධන/ සංචාරක කළමනාකරණ / ව්‍යාපාර කළමනාකරණ/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යවසාය කළමනාකරණය/ ආගන්තුක සත්කාර සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නොවන සේවා ගණයෙහි කළමනාකරණ සහකාර (MA 1-2) II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 5. කණිෂ්ඨ කළමනාකාර/ වෙබ් ප්‍රසන්ස් – (පුරප්පාඩු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම

හෝ

ii) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හී (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

iii) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හී (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

iv) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හී (NVQ) හත්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහ (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකරියේ තාක්ෂණික නොවන සේවා ගණයෙහි කළමනාකරණ සහකාර (MA 1-2) II ශ්‍රේණියේ සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**

JM 1-2 2025 රු. 74,010/- 10 x රු. 1,360/- 18 x රු.2,040/- රු. 124,330/- + ( ජීවන වියදම් දීමනාව)

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල අවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- සන්නිවේදන දීමනා
- ණය පහසුකම්

## 6. විමර්ශන නිළධාරී - පුරප්පාඩු 02

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ).
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංචාරක හා හෝටල් කළමනකරණ/ කළමනාකරණ/ නීති/ සමාජ විද්‍යා/ විද්‍යා/ ගණිත/ තොරතුරු තාක්ෂණ හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම සහ **අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්** තිබීම.

**වයස**

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**

MA5-2 2025 රු.62,310/- 10xරු.1,360/- 15xරු.1,670/- 5xරු.2,040/- රු.111,160/- +(ජීවන වියදම් දීමනාව)

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල අවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- ණය පහසුකම්

## 7. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - පුරප්පාඩු 10

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.
(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.
(ඇ) පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත (ආ), (ඇ) සහ (ඉ) සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කල හැකිය.
(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.
(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කර තිබිය යුතුය
(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප**

MA1-2 2025 රු.46,220/- 10xරු.540/- 7xරු.630/- 12xරු.1,080/- 12xරු.1,280/- රු.84,350/- + (ජීවන වියදම් දීමනාව)

**ප්‍රතිලාභ**

- සේවකයා සහ පවුල අවරණය වන ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්
- වෘත්තීය දියුණුව සඳහා පුහුණුව
- ප්‍රවාහන දීමනා
- ණය පහසුකම්

**සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
**අංක 80, ගාලු පාර,**
**කොළඹ 03.**

**ප්‍රකාශිත දිනය : 08.01.2026**